# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,730 - 2011 ඔක්තෝබර් මස 28 වැනි සිකුරාදා - 2011.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1630 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1632 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1635 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1639 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1640 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 නොවැම්බර් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ඔක්තෝබර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

යොමු අංකය : SRS/F. 6895.

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඉන්සියුලේටර් 200,000ක් ප්‍රසම්පාදනය**

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10 විසින් නිෂ්පාදකයන්ගෙන් හෝ සැපයුම්කරුවන්ගෙන් ඉන්සියුලේටර් 200,000 ක් මිල දී ගැනීම සඳහා මුද්‍රා තැබූ ලංසු මෙමගින් කැඳවනු ලැබේ. නිෂ්පාදකයනට මේ සඳහා වන ලංසු ඔවුන්ගේ ඇටර්නි බලය සහිත බලයලත් පත්කළ නියෝජිතයකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක.

02. ලංසු භාර ගැනීම 2011.11.15 වැනි දින (ශ්‍රී ලංකාවේ වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් කරනු ලැබේ.

03. මේ සඳහා අවශ්‍ය ලංසු ලියකියවිලි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයෙන් හෝ ශ්‍රී ලංකා විදේශීය තානාපති කාර්යාල මගින් 2011.11.14 වැනි දින ප. ව. 3.00 දක්වා (ශ්‍රී ලංකාවේ වේලාවෙන්) ආපසු නොගෙවන ලංසු ගාස්තු රුපියල් 2,500 හෝ එම මුදලට සරිලන සේ පහසුවෙන් මාරු කළ හැකි විදේශීය මුදල් මගින් ගෙවා ලබාගත හැක. ලංසු යොමු කළ යුත්තේ එසේ ලබාගත් ලියකියවිලි මාර්ගයෙන් පමණි.

04. ලංසු භාරගැනීම අවසන් කළ වහාම, සාමාන්‍යාධිකාරි කාර්යාලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10, යන ලිපිනයේ දී විවෘත කරන අතර මෙම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගිවන ලෙසට ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ හැක.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ලංසු ලියකියවිලි, ගාස්තු ගෙවීමෙන් තොරව පරීක්ෂා කිරීම, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය, ඕල්කොට් මාවත, කොළඹ 10 යන ලිපිනයේ දී සිදු කළ හැකි අතර, වැඩි විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක. දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය, 1347, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) ,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

10-663

---

යොමු අංකය : SRS/F. 6903.

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඩිස්ටන්ස් බෝල්ට්ස් 75000ක් නට්ස්, ෆෙරුල් සහ වොෂර් සමග අංගසම්පූර්ණව ප්‍රසම්පාදනය කිරීම**

කොළඹ 10, ඕල්කොට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (ප්‍රධාන) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් නට්ස්, ෆෙරුල් සහ වොෂර් සමග අංගසම්පූර්ණ ඩිස්ටන්ස් බෝල්ඞ්ස් 75,000ක් මිළට ගැනීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. ලංසු තබන්නන් විසින් සෘජුවම හෝ බලය පවරන ලද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි නියෝජිතයෙකු මගින් ලංසු ඉදිරිපත් කළ හැකි අතර ඔවුන් වෙත ඇටෝර්නි බලය මගින් බලය පවරා දිය හැකිය.

02. ලංසු ඉදිරිපත් කළ යුත්තේ 2011.11.07 වැනි දින ප. ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල වෙතින් රු. 2,500 ආපසු ගෙවනු නොලබන ආකෘති පත්‍ර ගාස්තුවක් ශ්‍රී ලංකා මුදලින් හෝ සමාන මුදලක් පහසුවෙන් හුවමාරු කරගත හැකි මුදල් වර්ගයකින් ගෙවීමෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණකි.

03. 2011.11.08 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වේ.

04. නට්ස්, ෆෙරුල්ස්, වොෂර්ස් සමග අංගසම්පූර්ණ ඩිස්ටන්ස් බෝල්ට්ස් නිෂ්පාදනය/සැපයීම භාර ගත යුත්තේ ISO 9001 : 2000/ BS EN ISO 9001 : 2000 හෝ ගැණුම්කරුට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර ප්‍රමිති කළමනාකරණ පද්ධති ප්‍රමාණය සහතික සහිත සමාගම් විසින් පමණකි.

05. ලංසු භාරගැනීම අවසන් වීමත් සමගම කොළඹ 10, ඕල්කොට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවා මූලස්ථානයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණ සිටින ලෙස ආරාධනය කෙරේ.

06. මුද්‍රිත ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව පැමිණ සභාපති, (ප්‍රධාන) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

07. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිළේ පරීක්ෂාකර බැලිය හැකි අතර වැඩිදුර විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරි, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

සභාපති,
(ප්‍රධාන) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

10-664

**මහාධිකරණය - කුරුණෑගල**

රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම

රම්බඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත සඳහන් රථ වාහන ටෙන්ඩර් කැඳවා විකිණීමට කුරුණෑගල මහාධිකරණය තීරණය කර ඇත. විකිණීමට අදාළ රථ වාහන පහතින් දක්වා ඇති ස්ථානයේ දී 2011.10.23 වැනි දිනට පසු අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇති අතර මීට අදාළ ටෙන්ඩර් ලියකියවිලි කුරුණෑගල මහාධිකරණය මගින් 2011.10.24 වැනි දින සිට 2011.11.08 වැනි දින දක්වා නිකුත් කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 100 ක පෝර්ම ගාස්තුවක් කුරුණෑගල මහාධිකරණයට ගෙවිය යුතු ය. මීට අමතරව රු. 2,000 ක ආපසු ගෙවන අප තැන්පත් මුදලක් ටෙන්ඩර් පෝර්ම ලබා ගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ය. අනෙකුත් විස්තර හා කොන්දේසි ටෙන්ඩර් ලියවිලි සමග ඔබට සපයනු ලැබේ.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *පරීක්ෂා කළ හැකි ස්ථානය* | *පරීක්ෂා කිරීම සඳහා අවසර ලබා ගත යුතු නිලධාරියා* |
|---|---|---|---|---|
| 1. | 51748 | NW JM - 2011 අංක දරන ත්‍රිරෝද රථය | රම්බඩගල්ල මහෙස්ත්‍රාත් අධිකරණය | රෙජිස්ට්‍රාර් |
| 2. | 5490 | NW QF - 4040 අංක දරන ත්‍රිරෝද රථය | එම | එම |
| 3. | 5273 | NW MA - 3560 අංක දරන CT 100 යතුරුපැදිය | එම | එම |
| 4. | 6939 | 70-6703 අංක දරන සී ෆැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය හා ටේලරය | එම | එම |
| 5. | 6366 | MA - 3593 අංක දරන CT - 100 වර්ගයේ යතුරුපැදිය | එම | එම |

එල්. යූ. ජයසූරිය,
මහාධිකරණ විනිසුරු.

10-559

---

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිළ ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2012***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමට මිළ ගණන් 2011 දෙසැම්බර් මස 01 වැනි දින පස්වරු 2.00 දක්වා අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවල දී භාරගනු ලැබේ. ඒ සඳහාවන විස්තර සහ ඉල්ලුම් පත්‍ර කාර්යාල වේලාවන් තුල අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250.00 (රුපියල් දෙසිය පනහක) මුදලක් ගෙවා 2011 දෙසැම්බර් මස 01 වැනි දින මධ්‍යයන 12.00 තෙක් ලබාගත හැක.

*උපලේඛනය*

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබාගත හැකි ස්ථාන* | *මිළ ගණන් භාරගැනීම* |
|---|---|---|---|---|
| බස්නාහිර | කළුතර | කළුතර (බිම්සවිය) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය කළුතර. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත), සර්වේයර් ජනරාල් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05. |

කවරයේ ඉහල වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිළ ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තර ද සහිතව 2011 දෙසැම්බර් මස 01 වැනි දින පස්වරු. 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාර දීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

10-614

# බඩු බාහිරාදිය විකිණීම

## මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2011.11.19 වැනි දින පෙ.ව. 9.30 ට බලපිටිය අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි සඳහන්වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර, ස්වකීය හිමිකම් ඉදිරිපත් කල යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාල භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

3. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා, වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

4. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිලි ගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතු අතර, භාණ්ඩ මිල දී ගැනීමට එන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත් ගෙන ඒම අනිවාර්ය වේ.

6. සියලුම ගෙවීම් මුදලින් විය යුතු අතර, මිල දී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දීම ප.ව. 6.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

එන්. ටී. අයි. අබේගුණසේකර,
මහෙස්ත්‍රාත්,
අතිරේක දිසා විනිසුරු,
බලපිටිය.

2011 ඔක්තෝබර් මස 05 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

*වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ උපලේඛනය*

| | | |
|---|---|---|
| 01. | නඩු අංක 3925 | අංක ජී. කේ. 6498 දරන ත්‍රිරෝද රථය |
| 02. | ඒ. ආර්. 1145 | අංක ටී. කේ. 3016 හීරෝ හොන්ඩා ස්පෙන්ඩර් යතුරුපැදිය |
| 03. | ඒආර් 576 | අංක රහිත යතුරු පැදිය (ලොන්සින් වර්ගය) |
| 04. | ඒආර් 588 | අංක 139-8817 දරන හොන්ඩා යතුරුපැදිය |
| 05. | ඒආර් 573 | අංක එස්පීඑම්ඩී -5105 ටී වී එස් ස්කූටි පෙප් වර්ගයේ යතුරුපැදිය |
| 06. | ඒආර් 854 | අංක එස්පීඑච්එෆ්-3420 සුසුකි වර්ගයේ යතුරුපැදිය |
| 07. | ඒආර් 575 | අංක එස්පීඑම්ජී - 1789 හොන්ඩා සී/50 යතුරුපැදිය |
| 08. | ඒආර් 418 | අංක එස්පීජේපී - 1773 වවීස් හන්සුම් යතුරු පැදිය |
| 09. | ඒආර් 630 | අංක රහිත කයිනටික් වර්ගයේ යතුරුපැදිය |
| 10. | ඒආර් 816 | අංක 138-8432 හොන්ඩා සීඩී/90 වර්ගයේ යතුරුපැදිය |
| 11. | ඒආර් 577 | අංක 111- 6326 යමහා වී/50 වර්ගයේ යතුරුපැදිය |
| 12. | ඒආර් 1328 | අංක රහිත ලොන්සින් සීඩී/90 වර්ගයේ යතුරුපැදිය |
| 13. | ඒආර් 1329 | අංක එස්පීජේජේ 5759 සොන්ෂයින් වර්ගයේ යතුරුපැදිය |
| 14. | ඒආර් 683 | අංක රහිත කවසාකි වර්ගයේ යතුරුපැදිය |
| 15. | ඒආර් 685 | ලියාපදිංචි නොකල ටීවීඑස් වර්ගයේ යතුරුපැදිය |
| 16. | ඒආර් 684 | ලියාපදිංචි නොකල ලොන්සින් යතුරුපැදිය |
| 17. | අංක රහිත | තලන ලද තඹ දඟර කැබලි තොගයක් |
| 18. | අංක රහිත | රබර් බට කැබලි තොගයක් |
| 19. | අංක රහිත | යකඩ වේවැල් කූඩ 24 ක් |
| 20. | පීආර් 96/10 | කැඩී ගිය යකඩ බාල්දියක් |
| 21. | පීආර් 59/10 | සවල් 01 යි |
| 22. | අංක රහිත | සවල් 01 යි |
| 23. | අංක රහිත | කැති 01 යි |
| 24. | පීආර් 77/11 | උදලු 02 යි |
| 25. | 34046 | උදලු 02 යි, සවල් 01 යි |
| 26. | 34083 | සවල් 02 යි |
| 27. | පීආර් 81/11 | ත්‍රිරෝද රථයක රෝදයක් |
| 28. | 5882 | යකඩ ඉනි 01යි |
| 29. | පීආර් 115/10 | සවල් 01 යි |
| 30. | අංක රහිත | ගෑස් ලිප සහිත කොටස |
| 31. | අංක රහිත | බාල්දි 03 යි (යකඩ) |
| 32. | අංක රහිත | ඩීසල් ලී. 100 අඩංගු කෑනය |
| 33. | 27570 | ඩීසල් ලී. 16 1/2 අඩංගු කෑනය |
| 34. | අංක රහිත | ත්‍රිරෝද රථයක පිටුපස ආසනය |
| 35. | 98749 | කැඩී ගිය යකඩ පුටු 02 යි |
| 36. | අංක රහිත | උදලු 01 යි |
| 37. | 99803 | යකඩ බාල්දි 01යි |
| 38. | අංක රහිත | බයිසිකල් හැඩලය |
| 39. | අංක රහිත | යකඩ කැබලි කිහිපයක් |
| 40. | ඒආර් 400/11 | කැඩී ඇති ශීතකරණයක් |
| 41. | පීආර් 56/11 | මිට සහිත උදලු 01 යි |
| 42. | 33864 | සවල් 01 යි |
| 43. | 32832 | සවල් 01 යි |
| 44. | 30757 | ගල් ඉනි 01 යි |
| 45. | පීආර් 40/11 | මිට සහිත උදලු 01 යි |
| 46. | පීආර් 77/11 | ගල් ඉනි 01 යි |
| 47. | 34131 | මිට සහිත උදලු 01 යි |
| 48. | 36306 | මිට සහිත උදලු 0 1යි |
| 49. | ඒආර් 430 | ඔරු 02යි |

| | | |
|---|---|---|
| 50. | 38991 | කියත් තල 01යි |
| 51. | 36685 | 1. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඩීසල් ලී. 2010 බැගින් අඩංගු බැරල් 03 යි<br>2. ඩීසල් ඇදීම සඳහා උපයෝගී කර ගන්නා අඩි 06 අගල් 05 දිග රබර් හෝස් බටය හා අඩි 03 අඟල් 02 ක් දිග යකඩ අත් පොම්පය<br>3. ඩීසල් මැනුම් උපකරණය<br>4. ඩීසල් ලී. 20 අඩංගු කෑනය |
| 52. | අංක රහිත | ඔරු 02 යි |
| 53. | අංක රහිත | කියත් තල 01 යි |
| 54. | | කැඩී ගිය බෝට්ටු 02 යි |
| 55. | 27675 | කියත් තල 01 යි |
| 56. | 29416 | කියත් තල 01 යි |
| 57. | 38493 | කියත් තල 0 1යි |
| 58. | පීආර් 25/11 | කියත් තල 01 යි |
| 59. | 34046 | විල්බැරෝ 01 යි |
| 60. | පීආර් 14/11 | විල්බැරෝ 01 යි |
| 61. | අංක රහිත | පාපැදි තොගයක් |
| 62. | අංක රහිත | දැති කියත් තල 03 යි |
| 63. | | දිරාගිය බැරල් තොගයක් |
| 64. | අංක රහිත | සවල් 01 යි |
| 65. | අංක රහිත | බූලි හා ගැලුම් තොගයක් |
| 66. | 35036 | ඔරුව හා කොල්ලෑව |
| 67. | පීආර් 53/11 | උදලු 01 යි |
| 68. | 92486 | උදලු 01යි |
| 69. | 93060 | උදලු 01 යි |
| 70. | අංක රහිත | උදලු 01යි |
| 71. | 168/09 | උදලු 01 යි |
| 72. | | යකඩ පනිට්ටු 01යි |
| 73. | 32307 | ප්ලාස්ටික් තාච්චි 01 යි |
| 74. | 36515 | ප්ලාස්ටික් බකට් 02 යි |
| 75. | 14927 | ඇලුමිනියම් කල 01 යි<br>පොඩි සාස්පාන් 05 යි |
| 76. | පීආර් 39/08 | තාච්චි 01 යි |
| 77. | 36916 | ඇලුමිනියම් මුට්ටි 01යි |
| 78 | අංක රහිත | වේවැල් කූඩ 05 යි |

Mobitel Phones

| | *Phone Model* | *Case No.* |
|---|---|---|
| 1. | Nokia (Rox colour) | 42152 |
| 2. | Tv Mobile (Chinese) | 33020 |
| 3. | Alfatel | 34081 |
| 4. | Nokia (Damaged) | 33045 |
| 5. | Tv Mobile (Chinese) Damaged | 34088 |
| 6. | Nokia (Screen Damaged) | 31345 |
| 7. | Sony Ericsson | 34444 |
| 8. | Alfatel | 34762 |
| 9. | Lephone | 31768 |
| 10. | Sigmate 1 FxD | 32919 |
| 11. | Chinese S- corde | 28390 |
| 12. | Alfatel | - |
| 13. | Alfatel | 26923 |
| 14. | Chinese Mobile | 28390 |
| 15. | F Forme | 30939 |
| 16. | Alfatel | 30101 |
| 17. | Dorado | 30660 |
| 18. | MBO | 30723 |
| 19. | Motarola | 25049 |
| 20. | Connecting World (Chinese) | 30482 |
| 21. | Motarola (c 168) | 29102 |
| 22. | Nokia (Colour) | 26067 |
| 23. | Blutooth (full Damaged) | 26132 |
| 24. | Nokia (2100) | 30262 |
| 25. | Alfatel | 29351 |
| 26. | Nokia (Colour) | 31162 |
| 27. | Nokia | 25275 |
| 28. | Nokia | 35891 |
| 29. | Egitel | 27886 |
| 30. | Egitel (Damaged) | 37573 |
| 31. | Sony Ericsson | 36936 |
| 32. | Nokia | 30011 |
| 33. | Nokia | 33986 |
| 34. | Sigmatel | 37283 |
| 35. | G. Five | 30474 |
| 36. | Connecting World | 30483 |
| 37. | Amgo | 35635 |
| 38. | Nokia | - |
| 39. | Nokia 3330 | 29762 |
| 40. | Alfatel | PR- 32 |
| 41. | Tv Mobile | - |
| 42. | Alfatel | - |
| 43. | Alfatel | - |
| 44. | Hxtel | - |
| 45. | Nokia N 95 (China) | 39783 |
| 46. | Nokia | 40078 |
| 47. | Qwerty | PR - 46/11 |
| 48. | 5130(No name) | 40884 |
| 49. | Alfatel | - |
| 50. | Lephone | 39464 |
| 51. | LG | 41453 |
| 52. | Alfatel | 40732 |
| 53. | Micromax | - |
| 54. | Alfatel | 40083 |
| 55. | Samsung (Funclub) | |

## මහෙස්ත්‍රාත් අධිකරණය - තිස්සමහාරාම

### අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා හිමිකම් නොකියන ලද භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

තිස්සමහාරාම මහෙස්ත්‍රාත් අධිකරණයේ පහත සඳහන් නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් අයිතිවාසිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2011.11.27 වන දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කරනු ලැබූ කිසියම් භාණ්ඩයක් සඳහා කිසිවෙකු විසින් හිමිකම් කියනු ලබන්නේ නම්, තම ඉල්ලීම වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණය මගින් නියම කරන ලද අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවකදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එකී වේලාවේදීම මුදල් ගෙවා ඒවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමේ දී ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛනයක් ඉදිරිපත් කළ යුතුයි.

06. වෙන්දේසිය පිළිබඳ සියලුම අවසන් තීරණ ගැනීමේ බලය මහෙස්ත්‍රාත්වරයා සතුවේ.

එච්. එස්. යූ. රම්‍යකුමාර,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත් තිස්සමහාරාම.

2011 සැප්තැම්බර් මස 26 වැනි දින,
තිස්සමහාරාමය,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 9418 | i. සවල් | 01 |
| | | ii. හිල් කරන ලද බාල්දි | 01 |
| 02 | 9419 | සවල් | 01 |
| 03. | 11254 | සවල් | 03 |
| 04 | 88693 | සවල් | 01 |
| 05 | 2488 | උදලු | 01 |
| 06 | 2494 | i. අලවංගු | 01 |
| | | ii. උදලු | 01 |
| 07 | 4358 | උදලු | 01 |
| 08 | 4497 | i. පොරව | 01 |
| | | ii. බංඩි කියත් | 01 |
| 09 | 11010 | කැති | 01 |
| 10 | 11011 | කැති | 01 |
| 11 | 12472 | අත් කියත් | 01 |
| 12 | 12952 | කැති | 01 |
| 13 | 12953 | කැති | 01 |
| 14 | 12954 | කැති | 01 |
| 15 | 12955 | පොරව | 01 |
| 16 | 12956 | කැති | 01 |
| 17 | 12957 | කැති | 01 |
| 18 | 13193 | i. කැති | 01 |
| | | ii. පොරව | 01 |
| 19 | 13320 | කැති | 02 |
| 20 | 13476 | කැති | 01 |
| 21 | 99050 | කැති | 03 |
| 22 | 62307 | උදලු | 01 |
| 23 | 3787 | වයර් අඩංගු පාර්සල් | 01 |
| 24 | 7419 | එම | 01 |
| 25 | 7441 | එම | 01 |
| 26 | 7912 | එම | 01 |
| 27 | 7917 | එම | 01 |
| 28 | 7920 | එම | 01 |
| 29 | 7921 | එම | 01 |
| 30 | 7922 | එම | 01 |
| 31 | 7923 | එම | 01 |
| 32 | 7924 | එම | 01 |
| 33 | 8471 | එම | 01 |
| 34 | 11310 | එම | 01 |
| 35 | 11852 | එම | 01 |
| 36 | 11863 | එම | 01 |
| 37 | 11865 | එම | 01 |
| 38 | 11866 | එම | 01 |
| 39 | 11867 | එම | 01 |
| 40 | 11868 | එම | 01 |
| 41 | 11869 | එම | 01 |
| 42 | 11870 | එම | 01 |
| 43 | 11871 | එම | 01 |
| 44 | 11872 | එම | 01 |
| 45 | 11873 | එම | 01 |
| 46 | 11874 | එම | 01 |
| 47 | 7194 | එම | 01 |
| 48 | 7192 | එම | 01 |
| 49 | 7193 | එම | 01 |
| 50 | 91317 | එම | 01 |
| 51 | බී.ආර්. 666/5 පරිඝනකය සහ එහි උපාංග කොටස් | | |
| 52 | 94187 | | |
| | (බී. ආර්. 700/7) ගෑස් සිලින්ඩර් | | 01 |
| 53 | 99494 | | |
| | (බී. ආර්. 582/9) | | |
| | | (i) ඔක්සිජන් ටැංකි | 01 |
| | | (ii) ගෑස් සිලින්ඩර් | 01 |
| | | (iii) ඔක්සිජන් බට | 02 |
| | | (iv) යකඩ කපන ලාම්පු | 01 |
| | | (v) ඔක්සිජන් මීටර් | 01 |
| 54 | ඒ.ආර්. 878/10 වතුර මෝටර් | | 01 |
| 55. | ඒ.ආර්. 325/11 ස්නොප් ලැප් සැන්ට්‍රා වර්ගයේ කැමරා | | 01 |
| 56. | 1419 | | |
| | (බී.ආර් 761/19) යාන්ත්‍රික දම්වැල් කියත් | | 01 |
| 57 | 5139 | | |
| | (ඒ.ආර්. 381/10) i. යාන්ත්‍රික දම්වැල් කියත් | | 01 |
| | | ii. අත් පොරව | 01 |
| 58 | 94507 | | |
| | (බී.ආර් 362/8) යාන්ත්‍රික දම්වැල් කියත් | | 01 |
| 59 | 6593 | යාන්ත්‍රික දම්වැල් කියත් | 01 |

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 60. | 71959පොලෙක්ස් වර්ගයේ වතුර මෝටර් | | | 01 |
| 61. | ඒ.ආර්.730/10 | i. | දිග අඩි 5 අඟල් 01 ක් පළල අඩි 2 ක් අඟල් 5 ක්වූ සෝලා පැනල් | 01 |
| | | ii. | සෝලා පැනලයෙන් ක්‍රියා කරන වතුර මෝටර් | 01 |
| | | iii. | පුටි වැල් | 01 |
| | | iv. | විදුලිය පරිපථ | 01 |
| | | v. | අඟල් 01 බට අඩි 1063 ක් | |
| | | vi. | වතුර ඉසින මල්බාල්දි | 01 |
| | | vii. | කෘෂි රසායන ඉසින තෙල්ටැංකි | 01 |
| 62. | ඒ.ආර්. 475/09 | | පාපැදි | 01 |
| 63. | ඒ.ආර්. 858/10 | | එම | 01 |
| 64. | ඒ.ආර්. 859/10 | | එම | 01 |
| 65. | ඒ. ආර්. 8/11 | | එම | 01 |
| 66. | ඒ.ආර් 102/11 | | අබලන් පාපැදි | 18 |
| 67. | ඒ.ආර්.256/11 | | පාපැදි | 01 |
| 68. | 2434(බී.ආර්.908/9) | | පාපැදි | 01 |
| 69. | 81745 | i. | පාපැදි | 01 |
| | | ii. | කැති | 01 |
| 70. | 82107 | i. | පාපැදි | 01 |
| | | ii. | පිහිය | 01 |
| | | iii. | පොරව | 01 |
| 71. | 86047 (බී.ආර්.52/8) | | පාපැදි | 02 |
| 72. | 99966(බී.ආර්.744/9) | | පාපැදි | 01 |
| 73. | ඒ.ආර්.124/09 | i. | සුදුපාට ඔරු | 01 |
| | | ii. | ලානිල්පාට ඔරු | 02 |
| 74. | ඒ.ආර්. 761/10 | i. | ෆයිබර් වර්ගයේ ඔරු | 02 |
| | | ii. | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01 |
| 75. | 7940 (ඒ.ආර්.681/9) | i. | ෆයිබර් ඔරු | 01 |
| | | ii. | ටයිගර් වර්ගයේ කැලි 02 විදුලි පන්දම් | 01 |

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 76. | 8004 | i. | ෆයිබර් ඔරු | 05 |
| | | ii. | කැලි 02 විදුලි පන්දම් | 02 |
| | | iii. | මේස පිහිය | 02 |
| | | iv. | හැලි වලං අඩංගු පොහොර උර | 01 |
| 77. | 8014(බීආර් 881/10) | | අංක රහිත ලා නිල් පාට ෆයිබර් ඔරු | 01 |
| 78. | 10257 | | කොළපාට ෆයිබර් ඔරු | 01 |
| 79. | ඒ.ආර්. 879/10 | | අංක රහිත ලානිල් පාට ෆයිබර් ඔරු | 01 |
| 80. | 3674/(බීආර් 165/10) | | ජංගම ලී ඉරන මැෂින් | 01 |
| 81. | 6505 | | එම | 01 |
| 82. | 8434 | | එම | 01 |
| 83. | 10901 | | එම | 01 |
| 84. | 10983 | | ජංගම ලී ඉරන මැෂින් | 01 |
| 85. | 87218 | | එම | 01 |
| 86. | 93189 | | එම | 01 |
| 87. | අංක රහිත | | එම | 10 |
| 88 | 67745 | | වර්ල් පූල් වර්ගයේ අධිශීතකරණ | 01 |
| 89. | අංක රහිත | | මාදැල් කිහිපයක් | |
| 90. | අංක රහිත | | හිස් විදුරු බෝතල් | 400 |
| 91. | අංක රහිත | | දිරාපත් දර ගොඩවල් | 04 |
| 92. | අංක රහිත | | වහලයෙන් ගලවා ඉවත්කරන ලද අබලන් වැහිපීහිලි කීහිපයක් | |
| 93. | අංක රහිත | | පැදුරු තොගයක් | |

**බඩු වට්ටෝරු ලේඛනයෙන් ඉවත් කරන ලද භාණ්ඩ**

| | | |
|---|---|---|
| 01. | වානේ කැබිනට් | 02 |
| 02. | ලී වලින් සාදන ලද ලිපි බන්දේසි | 11 |
| 03. | අබලන් විදුලි කේතල | 01 |
| 04. | වතුර මෝටර් | 04 |
| 05. | ලන්තෑරුම් | 01 |

10-567

---

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :-

01. සමාගමේ නම : සීමාසහිත සූරියගොල්ල ගමනැගුම ජනතා සමාගම
02. සමාගමේ අංකය : පී බී 4452
03. සංස්ථාගත කළ දිනය : 2011.02.21
04. ලිපිනය : සූරියගොල්ල, පිටමාරුව.

සමාගමේ ලේකම්.

10-555

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :-

01. සමාගමේ නම : සීමාසහිත පිටමාරුව ගමනැගුම ජනතා සමාගම
02. සමාගමේ අංකය : පී බී 4610
03. සංස්ථාගත කළ දිනය : 2011.03.03
04. ලිපිනය : පිටමාරුව, පස්සර.

සමාගමේ ලේකම්.

10-554

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී :-

01. සමාගමේ නම : සීමාසහිත අත්තනගොල්ල ගමනැගුම ජනතා සමාගම
02. සමාගමේ අංකය : පි බී 4440
03. සංස්ථාගත කළ දිනය : 2011.02.21
04. ලිපිනය : අත්තනගොල්ල, ලුනුගල

සමාගමේ ලේකම්.

10-550

### දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි:-

01. සමාගමේ නම : අසාහි කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
02. සංස්ථාගත කළ දිනය : 2011.09.23 වැනි දින
03. සමාගමේ අංකය : පී වී 81481
03. ලියාපදිංචි ලිපිනය : අංක 169/2, හිල් ස්ට්‍රීට්, දෙහිවල.

එකවුන්ට්ං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස්, (ප්‍රයිවට් ලිමිටඩ්),
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර, .
කොළඹ 04.

10-544

### ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

වෙන්නප්පුව එඩ්වඩ් ජෝශප් පෙරේරා මාවත පදිංචි (ජා. හැ. පත් අංක 577092907 V හිමි) රතුගමගේ ඈන් තෙරෙස් නිර්මලා ප්‍රනාන්දු වන මා විසින් කටුනේරිය, සිරි මැදුර පාර, පදිංචි (ජා. හැ. පත් අංක 586702645 V හිමි) පෝරුතොටගේ එලිසබෙත් ටන්ගනිකා ප්‍රනාන්දු හෙවත් ටැන්ගනිකා වෙත පවරන ලද එච්. ජේ. එම්. ඩී. ජයසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ අංක 16907 සහ 2007.10.05 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලබන බවත් මින් ඉදිරියට එම ඇටෝර්නි බලපත්‍රය මගින් කරනු ලබන කිසිදු කටයුත්තක් සම්බන්ධව මාගේ වගකීමක් නොමැති බවත් මෙයින් ප්‍රකාශ කරමි.

රතුගමගේ ඈන් තෙරෙස් නිර්මලා ප්‍රනාන්දු.

2011 සැප්තැම්බර් මස 28 වැනි දින.

10-575

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2011 ඔක්තෝබර් මස 03 වැනි දින සංස්ථාගත කරන ලදී:-

සමාගමේ නම : ඔරියන් ෆැසිලිටීස් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 81630
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ඔෆීස් 9, අංක 06, රාජකීය මාවත, කොළඹ 07

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්සන් සොලූෂන්ස් ඇන්ඩ්
සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

10-640

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

මොණරාගල වැල්ලවාය හි පදිංචි ප්‍රසිද්ධ නොතාරිස්, අජිත් ලියනආරච්චි මහතා විසින් වර්ෂ 2010.02.25 වැනි දින සහතික කළ අංක 218 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මොණරාගල, දඹගල්ල, මීගහපිටිය, තක්ෂිලා නිවස යන ලිපිනයේ පදිංචි වැලිගම ආරච්චිලාගේ ජයරත්න යන අයගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් මොණරාගල, දඹගල්ල, මීගහපිටිය, තක්ෂිලා නිවස යන ලිපිනයේ පදිංචිවී සිටි දිසානායක මුදියන්සේලාගේ ආරියරත්න යන අයට ලබා දී තිබූ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ඇති බවත්, එකී දිසානායක මුදියන්සේලාගේ ආරියරත්න යන අය විසින් මින් ඉදිරියට වැලිගම ආරච්චිලාගේ ජයරත්න යන අයගේ ඇටෝර්නි බලකරු වශයෙන් සිදු කරනුලබන කිසිදු ක්‍රියාවක් නීත්‍යානුකූල නොවන බවත් මෙයින් දන්වා සිටිමි.

ඇටෝර්නි අධිපති වන වැලිගම ආරච්චිලාගේ ජයරත්න.

10-660

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ග්‍රීන් - ග්‍රෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 ක් වූ සැප්තැම්බර් මස 05 වැනි දින සංස්ථාපනය කරන ලදී :-

සමාගමේ නම : ග්‍රීන් ග්‍රෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පි වී 81053
ලියාපදිංචි ලිපිනය : 'සුප්‍රා විලා' අංක 72, ශ්‍රී සරණංකර පාර, දෙහිවල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉ. මු. ම. බණ්ඩාර,
අධ්‍යක්ෂ.

දුරකථන අංක : 071-8244495/077 -81970141.

10-644

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව නැචුරල් එන්වයරන්මන්ටල් ප්‍රොටෙක්ෂන් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමෙහි නම මිරකල් -ග්‍රෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස 2011 ක් වූ සැප්තැම්බර් මස 09 වැනි දින වෙනස් කරන ලදී.

සමාගමේ නම : නැචුරල් එන්වයරන්මන්ටල් ප්‍රොටෙක්ෂන් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පි වී 63370
ලියාපදිංචි ලිපිනය : 'සුප්‍රා විලා' අංක 72, ශ්‍රී සරණංකර පාර, දෙහිවල.
සමාගමේ නව නම : මිරකල්-ග්‍රෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉ. මු. ම. බණ්ඩාර,
අධ්‍යක්ෂ.

දුරකථන අංක : 071-8244495/077 - 8197041.

10-645

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ආත්මා හීලින් ආයුර්වේද (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ආත්මා හීලින් ආයුර්වේද (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පි වී 81532
ලියාපදිංචි ලිපිනය : අංක 04, මොරටුමුල්ල නැගෙනහිර, මොරටුව

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී ඒ කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක : 071-8244495/077 - 8197041.

10-646

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව බිලූ ඕෂන් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 ක් වූ ඔක්තෝබර් මස 06 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : බ්ලූ ඕෂන් ඇඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පි වී 81720
ලියාපදිංචි ලිපිනය : අංක 9 බී, ජනසවිගම, පල්ලේකැලේ, මහනුවර

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ඒ. කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක : 071-8244495/077 - 8197041.

10-647

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඔමාලි ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 ක් වූ ඔක්තෝබර් මස 12 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඔමාලි ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පි වී 77 335
ලියාපදිංචි ලිපිනය : අංක 552/2 ඒ, මාකොළ උතුර, මාකොළ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක : 071-8244 495/077 - 8197041.

10-648

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ග්‍රීන්ස්ටෝන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 ක් වූ ඔක්තෝබර් මස 06 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ග්‍රීන්ස්ටෝන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පි වී 81 722
ලියාපදිංචි ලිපිනය : අංක 39/14, අංගම්පිටිය පාර, ඇතුල්කෝට්ටේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

විමල්සිරි වික්‍රමසින්හ,
ලේකම්වරු.

දුරකථන අංක : 071-8244495/077-8197041.

10-649

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නාමය : නෙට්ෆින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 81568
සංස්ථාගත කළ දිනය : 2011.09.28
ලියාපදිංචි ලිපිනය : අංක 43, අනගාරික ධර්මපාල මාවත, මහනුවර.

සමාගම් ලේකම්.

10-606

## ප්‍රසිද්ධ නිවේදනයයි

සෙනගල් (ප්‍රයිවට්) ලිමිටඩ් 2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියෙහි විධිවිධාන අනුව 2011 සැප්තැම්බර් මස 23 වැනි දින සිට සිය නාමය සිලෝන් හොලිඩේස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කරන ලද බව එම පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ මීට ප්‍රථම නම : සෙනගල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 16560
ලියාපදිංචි කාර්යාලය : අංක 216, ද සේරම් පෙදෙස, කොළඹ 10
සමාගමේ නව නාමය : සිලෝන් හොලිඩේස් හෝල්ඩිංස් (ප්‍රයිවට්)ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

සිලෝන් හොලිඩේස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

10-610

---

## දැන්වීමයි

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, හික්කඩුව, තිරාණගම, නිලේවත්ත, අංක 650/ඒ දරන ස්ථානයේ පදිංචි ප්‍රභාත් වන්නකුකෝරාල (ජා.හැ.අ. 843130569v) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් රංජනී ඊ. කළුපහන මහත්මියගේ අංක 16348 හා 2007.07.31 දිනැති ඇටර්නි බලපත්‍රය පිට මාගේ ඇටර්නි බලකරු වශයෙන් හික්කඩුව, තිරාණගම, නිලේවත්ත, අංක 650/ඒ දරන ස්ථානයේ පදිංචි වන්නකු කෝරාල මහින්දරත්න(ජා.හැ.අ. 571841517v) පත්කර තිබීම මෙයින් අවලංගු කර බලරහිත කරන බවත්, එසේ හෙයින් එකී අංක 16348 දරන බලපත්‍රය පිට ඔහු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු කටයුත්තකට මා වගනොකියන බවත් සියළු දෙනාටම මෙයින් මම දැනුම් දෙමි.

10-616

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

ඊකොලෙජ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සිය නාමය 2011 සැප්තැම්බර් මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පියර්) සන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කොට ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ. ඉහත කී පනතේ 8 වැනි වගන්තියෙහි විධිවිධාන අනුව මෙම වෙනස් කිරීම සිදුකර ඇත.

සමාගමේ නව නම : පියර්) සන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV62171
ලියාපදිංචි කාර්යාලය : අංක 216, ද සේරම් පෙදෙස, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

පියර්)සන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

10-612

## ප්‍රසිද්ධ දැන්වීමයි

වාන්ටේජ් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සිය නාමය 2011 සැප්තැම්බර් මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සුයිස් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කොට ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ. ඉහත කී පනතේ 8 වැනි වගන්තියෙහි විධිවිධාන අනුව මෙම වෙනස් කිරීම සිදුකර ඇත.

සමාගමේ පැරණි නම : වාන්ටේජ් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV18214
ලියාපදිංචි කාර්යාලය : අංක 327, යූනියන් පෙදෙස, කොළඹ 02.
සමාගමේ නව නාමය : සුයිස් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලේකම්වරු.

සුයිස් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්.

10-611

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කළුතර දිස්ත්‍රික්කයේ, ධර්ගානගරය, වරාපිටිය, ඔබහේන, අංක 101 E හි පදිංචි ජා.හැ.පත් අංක 580020739v හිමි කරුණාකලගේ නිමල් ද සිල්වා වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල, කොරතොට මැණික්කාගාර පාර, අංක 336/12 හි පදිංචි ජා. හැ. පත් අංක 665493636v දරන කොළඹතන්ත්‍රිගේ මානෙල් මංගලිකා පෙරේරා වෙත ප්‍රදානය කරන ලද, කළුතර, නාගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රියන්ත දේවප්‍රිය හෙට්ටිආරච්චි විසින් සහතික කරන ලද අංක 180 සහ වර්ෂ 1996 ජූනි මස 26 දින දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2011 ඔක්තෝබර් මස 28 දින සිට, මේ නිවේදනය මගින් අවලංගු කරන බවත්, එකී ලේඛනය මෙතැන් පටන් සම්පූර්ණයෙන්ම බල රහිත බවත්, ශ්‍රී ලංකා ජනරජයටත් සියලු පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි.

10-532

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගොඩකවෙල රංවල පදිංචි අතාවුද මුදියන්සේලාගේ එඩ්මන්ඩ් ආතාවුද බණ්ඩා බෝපෙගෙදර වන මා විසින් පැල්මඩුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රියාණි විජයගුණවර්ධන මහත්මිය විසින් සහතික කරන ලද වර්ෂ 2008 ක් වූ මාර්තු මස 07 වැනි දිනැති අංක 24559 දරන ඇටෝර්නි බලපත්‍ර මගින් ගොඩකවෙල රංවල දොලොස්වල වත්ත පදිංචි ගඟබඩ විදානෙලාගේ අජිත් ප්‍රියශාන්ත වෙත බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2011 ඔක්තෝබර් මස 04 දින පටන් අවලංගු කර බල රහිත කරන ලද බවත් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

අතාවුද මුදියන්සේලාගේ එඩ්මන්ඩ් අතාවුද
බණ්ඩා බෝපෙගෙදර.

2011 ඔක්තෝබර් මස 04 වැනි දින.

10-569

**දැන්වීමයි**

2007 ක් වූ අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම සංස්ථා ගත කරන ලදී :-

සමාගමේ නම : අයිඩියල් 2 වීලර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 81706
සංස්ථා ගත කළ දිනය : වර්ෂ 2011 ඔක්තෝබර් 6 වැනි දින
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 9, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.

නලින් වෙල්ගම,
අධ්‍යක්ෂ.

10-623

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 දරන වගන්තිය ප්‍රකාරව ඉලුමිනේට් එන්ටප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් වර්ෂ 2011 ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින සංස්ථාපනය කරන ලද බවට කරනු ලබන දැනුම්දීමයි.

සමාගමේ නම : ඉලුමිනේට් එන්ටප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV81610
ලිපිනය : අංක 24, ඩේලි ෆෙයාර් කම්ප්ලෙක්ස්, නුවරඑළිය.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

සමාගම් ලේකම්.

10-622

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**විදේශීය මත්පැන් රේන්ද විකිණීම - මඩකලපුව දිස්ත්‍රික්කය - 2012**

2012 ජනවාරි මස 01 වැනි දින සිට 2012 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ සියලුම සුරාබදු බලපත්‍ර වෙනුවෙන් දැනට බල පවත්වන සාමාන්‍ය කොන්දේසි සහ 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2012 වර්ෂය සඳහා විදේශීය මත්පැන් විකිණීමේ කොන්දේසි අනුව පහත සඳහන් ප්‍රදේශයන්හි විදේශීය මත්පැන් විකිණීමට අයිතිය මිල දී ගැනීම සඳහා මා විසින් පහත සඳහන් කර ඇති දින සහ වේලාව දක්වා මෙම කාර්යාලයේ දී ටෙන්ඩර්පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේ දී ටෙන්ඩර්කරුවන් මෙම දිසාපති කාර්යාලයට පැමිණිය යුතුය.

ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1,500 ක මුදලක් මඩකලපුව කච්චේරියේ තිබෙන ලංකා බැංකු ශාඛාවේ දිසාපති නමින් තිබෙන බැංකු ගිණුමට ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත් ලබා ගත හැකිය. ටෙන්ඩර් ඉල්ලුම්පත් සමග මෙම රිසිට්පත අමුණා තැබීම අත්‍යාවශ්‍ය වේ. ටෙන්ඩර්පත් නිකුත් කිරීම 2011.11.15 වැනි දින දහවල් 12.00 ට අවසන් වේ.

